Journal of Social Sciences, Volume 01, No. 01 (2014) ISSN 2362-0366

# 11. කාන්තා විදේශ සේවා නියුක්තිය එම කුටුම්භයන් මත සිදුකරන සමාජ ආර්ථික බලපෑම (මතලේ දිස්ත්‍රික්කයේ පලාපත්වල ග්‍රාම නිලධාරී වසම ආශ්‍රයෙනි.)

එස්. ඒ. යු. නිරංජලා, කථිකාචාර්ය, සමාජයීය විද්‍යා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය-මිහින්තලේ

**සංක්ෂිප්තය**

මැදපෙරදිග කලාපයේ තෙල් මිල ඉහළ යාමත් සමඟ ඇති වූ ආර්ථික, සමාජීය හා සංස්කෘතික අංශයන්ගේ ප්‍රවර්ධනීය වෙනසත් සමඟ විදේශ සේවා නියුක්තිය ආරම්භ විය. විදේශ ශ්‍රම සේවා නියුක්තය සඳහා යොමු වූ ශ්‍රී ලාංකිකයන් අතර මුල් කාලීනව කාන්තා නියෝජනය අවම මට්ටමේ වුවත් කාලයත් සමඟ ක්‍රමිකව වර්ධනය වීමක් දක්නට ඇත. නමුත් වර්තමානයේ ලාංකීය කාන්තාවන් විදේශ ගතවීම තුළින් සමාජය තුළ නොයෙකුත් ගැටළු ඇතිවීම සම්බන්ධයෙන් කතිකාවතක් ගොඩනැගෙමින් පවතින අවස්ථාවක කාන්තාවන් විදේශගත වීම සම්බන්ධයෙන් අධ්‍යයනය කළ යුතුව ඇත. මෙම පර්යේෂණයේ මූලික අරමුණ විදේශගත වූ කාන්තාවන් හට තම අපේක්ෂාවන් සාර්ථක කර ගැනීමට හැකි වීද යන්න සෙවීම වූ අතර අනෙකුත් අරමුණු වූයේ කුටුම්භ සාමාජිකයන්ගේ ජීවන රටාවේ ඇති වී ඇති වෙනස්වීම් , විදේශ ගත වන කාන්තාවන්ගේ ස්වභාවය හා විදේශයන්හිදී මුහුණ දෙන ගැටළු හඳුනාගැනීමයි. මෙහිදී ප්‍රාථමික දත්ත මෙන්ම ද්විතීක දත්තද උපයෝගී කරගත් අතර ප්‍රාථමික දත්ත රැස්කිරීම සඳහා පලාපත්වල ග්‍රාම නිලධාරී වසමේ විදේශගතව සිටි කාන්තාවන්ගෙන් යුත් නියැදියක් Snow Ball නියැදි ක්‍රමය භාවිතයෙන් තෝරා ගත් අතර සම්මුඛ සාකච්ඡා පැවැත්වීම මඟින් අවශ්‍ය දත්ත ලබා ගන්නා ලදි. ප්‍රධාන වශයෙන්ම වගු හා ප්‍රස්ථාර ආශ්‍රයෙන් දත්ත විශ්ලේෂණය සිදු කරන ලදී. මෙහිදී තම අරමුණු ඉටුකර ගැනීමට හැකි වී තිබුණේ සියයට 36.6 ක් වැනි අඩු ප්‍රමාණයකට පමණි. දරුවන්ගේ අධ්‍යාපනය අතරමග නතර වී තිබීම, සමාජ විරෝධී ක්‍රියාවන්ට පෙළඹීම, ස්වාමිවරු මත්පැනට ඇබ්බැහි වීම යනාදිය විදේශ සේවා නියුක්තියේ අහිතකර ප්‍රතිඵල වූ අතර විදේශයන්හිදී ශාරීරික හා මානසික හිංසනයන්ට ගොදුරු වීමක් සිදුවන බවත් අනාවරණය විය.

යොමු වචනඃ කාන්තා විදේශ සේවා නියුක්තිය, කුටුම්භය, සමාජ ආර්ථික බලපෑම, මාතලේ දිස්ත්‍රික්කය, ශ්‍රී ලංකාව

## හැඳින්වීම

1970 දශකයේ දී තෙල් මිල ඉහළ යාමත් සමඟ තෙල් සම්පතින් පොහොසත් මැද පෙරදිග කලාපයේ රටවල ආදායම් තත්ත්වය ඉහළයාම හේතුවෙන් නොයෙකුත් සංවර්ධන ව්‍යාපෘතීන්හි ආරම්භය සිදු වීමත් ඒ සඳහා අවශ්‍ය මිනිස් ශ්‍රමය ඌන වීම ප්‍රධාන සංරෝධකය වීමත් නිසා දියුණුවෙමින් පවතින රටවල්වලින් මිනිස් ශ්‍රමය ලබා ගැනීමට පෙළඹිණි. එහි දී ප්‍රථමයෙන් ම විදේශ සේවා නියුක්තිය කෙරෙහි පුරුෂ පාර්ශවයට මඟ පෑදුණ අතර දෙවනුව ආර්ථික සංවර්ධනයත් සමඟ ඇති වූ සමාජීය තත්ත්වයේ දියුණුවත් සමඟ ගෘහ කටයුතු ඉටුකර ගැනීම සඳහා විදේශීය රටවලින් කාන්තා ශ්‍රමය ලබා ගැනීමට උත්සුක විය.

සංවෘත ආර්ථික ප්‍රතිපත්තියත් සමඟ 1970 - 1977 කාල සීමාව තුළ ශ්‍රී ලංකාව විදේශීය වෙළඳපළට විවෘත වූයේ අවම මට්ටමින් වුවත් 1977 න් පසු විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වා දීමත් සමඟ ලෝක ආර්ථිකය සමඟ සම්බන්ධතා පැවත්වීම ඉහළ යන ලදි. විශේෂයෙන් ම විදේශ සංචාර සම්බන්ධයෙන් පැවති පාලනයන් ලිහිල් කිරීමත් සමඟ පුහුණු සහ නොපුහුණු ශ්‍රමිකයින් විශාල පිරිසකට මැද පෙරදිග රැකියා සඳහා අවස්ථාව උදා වූ අතර ඒ තුළින් ඔවුනට සැලකිය යුතු ප්‍රමාණයක ඉතුරුම් තම කුටුම්භයන්හි සාමාජිකයන් වෙත ප්‍රේෂණය කළ හැකිවිය. විදේශ සේවා නියුක්තියට ඉඩප්‍රස්ථා සැලැස්වීමේ අරමුණු වශයෙන් රැකියා නියුක්තිය, ජීවන මට්ටමේ උසස්වීම හා ඒ තුළින් ආර්ථික සංවර්ධනය අපේක්ෂා කෙරේ. රැකියා වියුක්ත වුවත් දේශීය මෙන්ම විදේශීය අංශයේ කුමන හෝ ක්ෂේත්‍රයක රැකියාවකට යොමු කිරීමට හැකිවීම රැකියා වියුක්ති ප්‍රශ්ණයට විසඳුමක් වන්නාසේ ම එමඟින් ජීවන මට්ටමේ උසස් වීම සහ දිළිඳුභාවය අඩු කිරීමට අපේක්ෂා කෙරෙයි. සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයකට සේවා වියුක්ති අනුපාතිකය ඉහළයාම සංරෝධකයක් වන හෙයින් රැකියා වියුක්තිය අවම කිරීම සඳහා ඇති නොයෙකුත් ක්‍රියාමාර්ග අතුරින් විදේශ සේවා නියුක්තිය සේවා නියුක්තියෙහි ප්‍රධාන මූලාශ්‍රයක් ලෙස සැලකීමට පුළුවන (ශ්‍රී ලංකා මහ බැංකුව:2012). නමුත්, ශ්‍රී ලංකා ආර්ථිකය දෙස බැලීමේ දී තවමත් සේවා වියුක්ති අනුපාතිකය ඉහළ අගයක් වාර්තා කරන අතර එයිනිඳු කාන්තා අංශයේ සේවා වියුක්ති අනුපාතිකය පුරුෂ අංශයේ සේවා වියුක්ති අනුපාතිකයයේ දෙගුණයටත් වඩා වැඩි ය. වර්ෂ 2011දී සේවා වියුක්ති අනුපාතිකය ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස සියයට 4.2ක අගයක් ගත් අතර පුරුෂ පක්ෂයේ සේවා වියුක්ති අනුපාතිකය සියයට 2.7ක් සහ කාන්තා පක්ෂයේ සේවා වියුක්ති අනුපාතිකය සියයට 6.8ක් ද විය.

ශ්‍රී ලංකා සමාජය තුළ කාන්තාවන්ගේ භූමිකාව සමාජීය, ආර්ථික හා දේශපාලන මෙන්ම මානව විද්‍යාත්මකව ද ඉතාමත් වැදගත් වේ. නිදහසට පෙර සමාජය තුළ කාන්තාව පීතෘ මූලික සමාජයක් තුළ ක්‍රියා කළ ද සමාජ ක්‍රමයේ විකාශනයත් සමඟ එසේ සම්ප්‍රදායික වශයෙන් උරුම වී තිබූ ආචාර ධර්ම පද්ධතියෙන් මිදී වෙනස් මාවතකට ගමන් කිරීමට කාන්තාවට අවස්ථාව උදා වී ඇත. පිරිමින් පමණක් ධනෝපායන මාර්ගවල නිරතවීම ප්‍රමාණවත් නොවීම මත කාන්තාවන් දේශීය හා විදේශීය වශයෙන් රැකියා සොයා යාමේ ප්‍රවනතාවන් වර්ධනය වී ඇත. බටහිර රටවල කාන්තා විමුක්ති සංවිධාන, කාන්තා කාර්යාංශය, තරුණ සේවා සභාව වැනි ආයතනවල දිරිගැන්වීම් කාන්තාවන් රැකියා සඳහා පෙළඹවීම වර්ධනයට හේතු වී ඇති අතර කාන්තාවන් රැකියාවන්හි නිරත වීම සෘජුවම කුටුම්භයන් හි ආදායම් උත්පාදනයට හේතුවක් බවට පත්ව ඇත (හේරත්, 2000). මෙසේ කාන්තාවන් දේශීය රැකියාවන්හි නිරතවීම තුළින් ආදායම් උත්පාදනය වී ආර්ථිකමය වශයෙන් ශක්තිමත් වුවත් විශේෂයෙන් කාන්තාවන් රැකියා සඳහා විගමනය වීම සම්බන්ධයෙන් ඔවුන්ගේ කුටුම්භයන්හි සාමාජිකයන් වෙත නොයෙකුත් සෘණාත්මක බලපෑම් ඇති කරන බව පර්යේෂකයෝ දක්වති.

සේවා වියුක්තිය අවම කිරීමට හැකිවීම, ගෙවුම් ශේෂ අර්බුදයට මුහුණදීමට යම් ශක්තියක් වීම, ශ්‍රමිකයින්ගේ නිපුණතා වර්ධනය කර ගැනීමට හැකිවීම යන කරුණු නිසා විදේශ සේවා නියුක්තිය ආර්ථිකයේ වැදගත් කාර්යයක් ඉටු කරයි. ශ්‍රී ලාංකික සමාජයේ තවමත් සැලකිය යුතු පිරිසක් (8.9%) දරිද්‍රතාවයෙන් පීඩා විඳිති. විශේෂයෙන් ම ග්‍රාමීය දිළිඳු ජනතාව සහ නාගරික අඩු ආදායම් ලාභීන් දැඩි ලෙස ආර්ථික පීඩනයට ලක්ව සිටිති. පවතින ආර්ථික හා සමාජීය රටාව තුළ පවුලේ එක් අයෙක් පමණක් ආර්ථික සම්පත් ඉපයීමෙන් ලැබෙන වැටුප ප්‍රමාණවත් නොවීම, පවුලේ යැපෙන්නන් සංඛ්‍යාව වැඩිවීම

සහ පවතින පාරිභෝජන රටාව යන කරුණු නිසා ඔවුහු මෙම තත්ත්වයට පත්වී ඇත. මෙම තත්ත්වය මත කාන්තාවන් තමන්ට සමාජීය වශයෙන් පැවරී ඇති වගකීම්වලට අමතරව ආදායමක් ඉපයීම සඳහා තෝරා ගන්නා එක් ප්‍රබල මාර්ගයක් වශයෙන් විදේශ සේවා නියුක්තිය දැක්විය හැකිය.

## විදේශීය සේවා නියුක්තියේ විකාශනය

සේවා නියුක්ති ඉඩ ප්‍රස්ථා සොයා ලාංකිකයන් විදේශීය රටවල් කරා සංක්‍රමණය වීම දීර්ඝ ඉතිහාසයකට හිමිකම් නොකියයි. ශ්‍රී ලාංකිකයන් විදේශ රැකියා සඳහා පිටත්ව යාම ආරම්භ වන්නේ විසිවන ශතවර්ෂයේ මුල් කාලීනව බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය පාලන සමයේ දී ය. මෙරට ද්‍රවිඩ ජනතාව සුළු වශයෙන් මැලේසියාව වෙත සංක්‍රමණය වීම එහි ආරම්භක අවස්ථාව ලෙස දැක්විය හැකිය (රුහුණගේ, 1996). එමෙන්ම සුළු පිරිසක් සිංගප්පූරුවට හා හොංකොං යන රටවලටද සංක්‍රමණය වූහ (Gunathilake, 1998). නමුත් ජාත්‍යන්තර වශයෙන් ශ්‍රම විගමනය පිළිබඳව මෙරට පැහැදිලි අත්දැකීම් ලැබීම ආරම්භ වූයේ 1948 නිදහස ලැබීමෙන් පසුව ය. මෙරට බොහෝ බර්ගර් ජාතිකයෝ ඕස්ට්‍රේලියාව හා නවසීලන්තයට සංක්‍රමණය වීමේ ප්‍රවණතාවක් පැවතුණාහ (රුහුණගේ, 1996). ලංකාවට නිදහස ලැබීමෙන් පසු ලන්දේසී හා පෘතුගීසි උරුමයක් පවතින පදිංචිකරුවෝ එසේ ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වී ඇත (Gunathilake, 1998).

1960 දශකය අවසාන වන විට සංක්‍රමණයේ වෙනත් ප්‍රවණතාවක් දක්නට ලැබුණි. ආර්ථිකමය සංක්‍රමණය ලංකාවේ අධ්‍යාපනික හා වෘත්තීය දායකත්වයෙන් යුත් පිරිසකගෙන් සමන්විත වීම මෙකී තත්ත්වයයි. මෙම යුගයේ ප්‍රධාන වශයෙන් ම අධ්‍යාපනය ලත් පුද්ගලයෝ විශේෂයෙන් වෛද්‍යවරුන්ගෙන් සමන්විත වූ අතර ඔවුහු එංගලන්තය, ඇමරිකා එක්සත් ජනපදය, කැනඩාව, ඕස්ට්‍රේලියාව හා නවසීලන්තය වැනි රටවලට සංක්‍රමණය වූහ. ගණකාධිකාරිවරු සහ ගුරුවරු වැනි වෘත්තිකයන් සුළු වශයෙන් අප්‍රිකාවේ රැකියා අවස්ථා සොයා ගනු ලැබූහ ( Gunathilake, 1998). මෙලෙස පුහුණු මිනිස් බලය 1970 දශකයේ දී පිටට ඇදී යාම නිසා ලංකාව තුළ බුද්ධිගලනය පිළිබඳ ප්‍රශ්න මතුවන්නට විය.
1972 න් පසු දශක දෙකක මෙරට ශ්‍රම විගමනයේ පැහැදිලි සංවර්ධනයක් පෙන්නුම් කර ඇත. 1974 ජනවාරි මාසයේ සිට අමුතෙල් බැරලයක මිල ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 33 ක් දක්වා ඔපෙක් සංවිධානය විසින් වැඩිකරන ලදි. තෙල් සම්පතින් පොහොසත් මැද පෙරදිග කලාපයට අතිරික්ත ආදායම ඔවුහු ආයෝජනය කිරීම සඳහා උනන්දු වූවෝ ය. මෙම රටවලට ඒ සඳහා පිටරටවල ආයෝජනය කිරීම හා තම රටවල ආයෝජනය කිරීම ලෙස විකල්ප මාර්ග දෙකක් විය. නමුත් පිටරටවල ආයෝජනය කිරීමෙන් තමන්ට ලැබිය හැකි ප්‍රතිලාභ පිළිබඳව ස්ථිර අවබෝධයක් ඔවුනට නොතිබුණ බැවින් ඔවුනට අනිවාර්යයෙන්ම කළයුතු වූයේ තම රටවල ගොඩනැගිලි ව්‍යාපෘති හා සෙසු සේවාවන් දියුණු කිරීම ය.


ඒ අනුව 1975 දී රැකියාවන් සඳහා මැදපෙරදිග රටවලට ශ්‍රී ලංකාවෙන් විගමනය වීම ආරම්භ වූ අතර එය වේගයෙන් වර්ධනය විය (Gunathilake, 1998). අරාබියේ අතිරික්ත ආදායමෙන් තම රටවල් සංවර්ධනය කිරීමට දරන ප්‍රයත්නයත් සමඟ විවිධ රැකියා අවස්ථා ඇති වුණි. ඇලුමිනියම් උපකරණයක් ඩුබායි හි ඉදිකිරීම, සෞදි අරාබියේ ජුබයිල් වරාය ව්‍යාපෘතිය මෙවැනි සංවර්ධන ව්‍යාපෘතීන් ඒ අතර වෙයි. මෙලෙස සංවර්ධන ව්‍යාපෘතීන්

ආරම්භ කළත් ඒ සඳහා එම රටවල මිනිස් බලය ප්‍රමාණවත් නොවීම නිසා ශ්‍රම අවශ්‍යතාවයන්ගෙන් විශාල කොටසක් සපුරන ලද්දේ වඩාත් දිළිඳු අරාබි රාජ්‍ය වලින් හා ජෝර්දානය, යේමනය, ඇෆ්ගනිස්ථානය යන රටවල සිට දකුණු කොරියාව දක්වා විහිදී ඇති සංවර්ධනය වෙමින් පවතින ආසියාතික රටවල් වලිනි.

## ස්ත්‍රී පුරුෂ භාවය අනුව විදේශ සේවා නියුක්තිය

ප්‍රථමයෙන් ලාංකීය පිරිමි පාර්ශවයට මැදපෙරදිග රැකියාවන් සඳහා යාමට අවකාශ ලැබිණ. මේ අනුව ශ්‍රී ලංකාවේ පුරුෂ සංක්‍රමණය 1976 දී සියයට 99.05 ක ඉහළ මට්ටමක පැවති අතර එය 2008 වන විට සියයට 51.12 ක් දක්වාත් 2009 වන විට සියයට 48.3 ක ප්‍රතිශතයක් දක්වාත් අඩු වී නැවත 2011 වන විට සියයට 51.7 දක්වා ඉහළ ගොස් ඇත. 1976 දී කාන්තා ශ්‍රම සංක්‍රමණික ප්‍රතිශතය සියයට 0.95 ක පහළ මට්ටමක පැවති අතර එය 2008 දී සියයට 48.88 දක්වාත් 2009 වනවිට සියයට  51.7 ක ප්‍රතිශතයක් දක්වා ද ඉහළ ගොස් ඇති අතර 2011 දී සියයට 48.3 දක්වා අඩුවී ඇත. මෙකී කාන්තා පිරිසෙන් වැඩි දායකත්වය ගෘහ සේවිකාවන් විසින් දරනු ලැබීය. මේ සඳහා හේතු වී ඇත්තේ 1976 න් පසු මැදපෙරදිග රටවල සංවර්ධනය සමඟ ඇති වූ සමාජීය තත්ත්වයේ වෙනසයි. ඒ අනුව අරාබි ජාතිකයෝ තම ගෘහ කටයුතු පහසු කරගැනීමට විදේශීය ගෘහ සේවිකාවෝ ලබාගැනීමට උනන්දුවක් දක්වන ලද්දෝය. මෙලෙස විශාල වශයෙන් ශ්‍රී ලාංකිකයින් විගමනය වීම හේතුවෙන් ඔවුන්ගේ සුභසාධනය හා ආරක්ෂාව පිළිබඳව සැලකිලිමත් වීමක් වශයෙන් 1985 අංක 21 දරණ පනත යටතේ විදේශ සේවා නියුක්ති කාර්යාංශය පිහිටවනු ලැබී ය(අත්තනායක, 1996). වර්තමානය වන විට විදේශ සේවා නියුක්තිය රට තුළට විදේශ විනිමය ගලා එන වැදගත් හා ස්ථාවර මූලාශ්‍රයක් වී ඇත. විදේශ රැකියා සඳහා පිටත්ව ගිය මුළු සංඛ්‍යාව වර්ෂ 2010දී  266,445 වූ අතර එය 2011දී 262,960 දක්වා සියයට 1.3 කින් අඩු වී ඇත. විදේශ රැකියා සඳහා පිටත්ව ගිය මුළු සංඛ්‍යාවෙහි හැසිරීම පහත රූපසටහන 1 හා වගු අංක 1 ආශ්‍රයෙන්  අවබෝධ කර ගත හැකිය.

RUSL




රූපසටහන 1 . ස්ත්‍රී පුරුෂ භාවය මත ශ්‍රම සංක්‍රමණය

*වගු අංක 1 ස්ත්‍රී පුරුෂභාවය අනුව ශ්‍රම සංක්‍රමණය*

| වර්ෂය | පුරුෂ | | ස්ත්‍රී | | මුළු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | % | ප්‍රමාණය | % | ප්‍රමාණය |
| 1976 | 524 | 99.5 | 5 | 0.95 | 529 |
| 1986 | 11,023 | 66.98 | 5,433 | 33.02 | 16,456 |
| 1996 | 43,112 | 26.52 | 119,464 | 73.48 | 162,576 |
| 2006 | 90,170 | 44.65 | 111,778 | 55.35 | 201,948 |
| 2007 | 103,476 | 47.37 | 114,983 | 52.63 | 218,459 |
| 2008 | 128,821 | 51.12 | 123,200 | 48.88 | 252,021 |
| 2009 | 119,276 | 48.3 | 127,843 | 51.7 | 247,119 |
| 2010 | 136,850 | 51.2 | 130,657 | 48.8 | 267,507 |
| 2011 | 135870 | 51.7 | 127,090 | 48.3 | 262,960 |

*මූලාශ්‍රය: - ශ්‍රී ලංකා මහබැංකු වාර්තා ආශ්‍රයෙනි*


සම්ප්‍රදායික නොවන වෙළඳපොළවල නව වෙළඳපොළ අවස්ථාවන් සොයා ගැනීම සඳහා දැරූ ප්‍රයත්නයත්,සංක්‍රමික ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරමින් අනිසි ක්‍රියා පිටුදැකීම සඳහා කළ අදාළ නීති සංශෝධනයන් හා අනෙකුත් ආරක්ෂණ හා සුභසාධන ප්‍රතිපත්ති නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම තුළින් විදේශ රැකියා අවස්ථාවන් සහ රටෙහි විනිමය සංක්‍රාම තවදුරටත් වැඩිදියුණු කිරීමට මඟ පාදා ඇත. ඒ අනුව සංක්‍රමික සංක්‍රමණික ශ්‍රමික ජනගහනයේ සිදුවූ වර්ධනයන්හි ප්‍රතිඵලයක් ලෙස 2010 දී එ.ජ. ඩොලර්

මිලියන 4,116 ක් වූ මුළු විදේශ සංක්‍රාම 2011දී එ.ජ. ඩොලර් මිලියන 5,145 ක් දක්වා සියයට 25 කින් ඉහළ ගොස් ඇත (ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව, 2012. පි.86).


*වගු අංක 2 . පුරුෂ සංක්‍රමික සේවකයින් , ස්ත්‍රී සංක්‍රමික සේවකයින් සමඟ සන්සන්දනය*

| වර්ෂය | පුරුෂ | | ස්ත්‍රීන් | | | | |
|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | ගෘහසේවිකා | | වෙනත් | | මුළු ස්ත්‍රීන් සංඛ්‍යාව |
| | | | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | |
| 1996 | 43,112 | 26.52 | 110,479 | 67.96 | 8,985 | 5.53 | 119,464 |
| 2000 | 59,793 | 32.82 | 99,413 | 54.57 | 22,982 | 12.61 | 122,395 |
| 2004 | 80,699 | 37.59 | 110,512 | 51.47 | 23,498 | 10.94 | 134,010 |
| 2005 | 93,896 | 40.60 | 125,493 | 54.26 | 11,901 | 5.15 | 137,394 |
| 2006 | 90,170 | 44.65 | 99,659 | 49.35 | 12,119 | 6.00 | 111,778 |
| 2007 | 103,476 | 47.37 | 102,355 | 46.85 | 12,628 | 5.78 | 114,983 |
| 2008 | 128,821 | 51.12 | 108,709 | 43.13 | 14,491 | 5.75 | 123,200 |
| 2009 | 119,381 | 48.3 | 113,678 | 46 | 14,067 | 5.7 | 127,745 |
| 2010 | 136,850 | 51.2 | 113,087 | 42.4 | 17,570 | 6.4 | 130,657 |
| 2011 | 135870 | 51.7 | 107,500 | 40.9 | 19,590 | 7.4 | 127,090 |

*මූලාශ්‍රය: - ශ්‍රී ලංකා මහබැංකු වාර්තා ආශ්‍රයෙනි*




විදේශීය සේවා නියුක්තියෙහි අඛණ්ඩව ප්‍රමුඛත්වයක් දරනුයේ ගෘහ සේවිකාවන්ගේ සංඛ්‍යාවයි. වර්ෂ 2010දී 113,087 ක්වූ ගෘහ සේවිකාවන්ගේ සංඛ්‍යාව 2011 වර්ෂයේදී 107.500 දක්වා අඩුවී එනම් සියයට 4.9කින් අඩුවී ඇති අතර විදේශ ගත වීම්වලින් ගෘහසේවිකාවන්ගේ සාපේක්‍ෂ වැදගත්කම 2010 හි පැවති සියයට 42.4 සිට 2011 දී සියයට 40.9 දක්වාද අඩුවී ඇතත් තවමත් විදේශ සේවා අංශයෙහි ප්‍රමුඛස්ථානය ගැනීමට ගෘහසේවිකාවන්ට හැකි වී ඇත(වගු අංක 02). තවද ගෘහ සේවිකාවන්ගෙන් බහුතරය එනම් සියයට 94.4 කට වඩා සේවය කරනුයේ මැදපෙරදිග කලාපය තුලයි. සෞදි අරාබිය, කටාර්,කුවේට් සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය 2012 දී විදේශ රැකියා වලින් සියයට 84.3 ක් සපයා ඇත (ශ්‍රී ලංකා මහ බැංකුව,2012.පි.113).




*රූපසටහන 2 .ශ්‍රම කාණ්ඩ අනුව විදේශ සේවා නියුක්තිය- 2011*

ශ්‍රම කාණ්ඩ අනුව විදේශ සේවා නියුක්තිය පිළිබඳව විමසිලිමත් වීමේදී අනාවරණය වනුයේ තවමත් ඉතා ඉහළ ප්‍රතිශතයක් නියෝජනය කරනුයේ ගෘහසේවිකාවන් බවයි. වර්ෂ 2011දී ගෘහසේවිකාවන් වශයෙන් විදේශ සේවා නියුක්ත වූවන්ගේ ප්‍රතිශතය සියයට 40.9ක් වේ.

## අධ්‍යයන ගැටළුව සහ අරමුණු

කාන්තාවන් විදේශ සේවාවන්හි නිරත වීම කුටුම්භ ආර්ථික අර්බුදයට පිළියමක් වෙද්දී කුටුම්භය තුළ නොයෙකුත් ගැටලු රාශියකටද මාර්ගය පෑදී ඇත. ශ්‍රී ලාංකික සමාජය තුළ තවමත් කාන්තාවට සුවිශේෂී ස්ථානයක් හිමි වන්නේ ඇය විටෙක මවක, බිරිඳක හා ගෘහනියක ලෙස විවිධ වූ භූමිකාවන් නිරූපණය කරන නිසාය. එවන් විශාල කාර්යභාරයක් ඉටුකරන ඇය දිගු කාලීනව නිවසින් බැහැර වීම කුටුම්භ සාමාජිකයින් කෙරෙහි අහිතකර ආකාරයට බලපායි. විදේශගත වීමට ප්‍රථම තිබූ දිළිඳුකම හැරෙන්නට නැවත පැමිණෙන විට වෙනත් ආකාරයක ගැටලු රාශියකට මුහුණපෑමට ඔවුනට සිදුවේ. එපමණක් නොව බොහෝ කාන්තාවන් නුපුහුණු ශ්‍රමිකයින් වශයෙන් විදේශගත වීම තුළ විදේශයන්හි ද ඔවුනට බොහෝ ප්‍රශ්නවලට මුහුණපෑමට සිදු වේ. මෙසේ කාන්තාවන් විදේශ ගතවීම තුළින් නොයෙකුත් ගැටළුකාරී තත්ත්වයන් සමාජගත වන බැවින් ඇතැම් රටවල් කාන්තා ශ්‍රම විගමනය සම්බන්ධයෙන් සීමාකාරී ප්‍රතිපත්තියක් අනුගමනය කරනු දක්නට ඇත. පිලිපීනය හා ඉන්දුනීසියාව ශ්‍රම සංක්‍රමණය අඩු කිරීම සඳහා නීති රීති පනවා ඇත. පකිස්ථානය හා බංගලාදේශය යන රටවල සංස්කෘතික හේතුන් මත කාන්තා ශ්‍රම සංක්‍රමණය සිදු නොකරයි. ඉන්දියාව ශ්‍රම සංක්‍රමණය තහනම් කර ඇත (ගුණරත්න, 2005). කෙසේ වෙතත් කලාපයේ අනෙකුත් රටවල තත්ත්වය මෙය වුවත්, ශ්‍රී ලාංකීය කාන්තාවන් තවමත් විදේශ සේවා නියුක්තියෙහි වැඩි ප්‍රතිශතයක් නියෝජනය කරයි. ලාංකීය සමාජයේ කාන්තාවන් විදේශ ගතවීම තුළින් සමාජය තුළ නොයෙකුත් ගැටලු ඇතිවීම හේතුවෙන් මේ සම්බන්ධයෙන් සමාජය තුළ කතිකාවතක් ගොඩනැගෙමින් පවතින අවස්ථාවක විදේශගත වූ කාන්තාවන් සම්බන්ධයෙන් හා ඔවුන් මුහුණදෙන ගැටලු සම්බන්ධයෙන් අධ්‍යයනය කළ යුතුව ඇත. මන්ද ඒ තුළින් කාන්තාවන් විදේශගත වීම කෙරෙහි තවදුරටත්

ප්‍රතිපත්ති සම්පාදකයන්ට ප්‍රතිපත්තිමය තීරණ නිවැරදි ආකාරයට ගැනීමට හැකිවන නිසාය. ආර්ථිකමය වශයෙන් කෙටිකාලීනව විසඳුම් සෙවීමේ අරමුණින් කාන්තාවන් විදේශගත වීම තුළින් දිගු කාලීන වශයෙන් සමාජයට ඍණාත්මක බලපෑම් එල්ල කරයි නම් අනාගත සංවර්ධනයට එය අහිතකර ආකාරයට බලපෑම් එල්ල කරනු ඇත.

විදේශීය සේවා නියුක්තිය සෘජුවම සේවා වියුක්තියට පිළියමක් වන්නා සේම රට තුළට විදේශ විනිමය ගලා එන වැදගත් හා ස්ථාවර මූලාශ්‍රයක් වී ඇත. නමුත් විශේෂයෙන්ම විවාහක කාන්තාවන් විදේශ ගත වීම සම්බන්ධයෙන් නොයෙකුත් ගැටලු සමාජය තුල නිර්මාණය වීමත් එසේ වූවත් තවමත් ලාංකීය කාන්තාවන් රැකියා සඳහා විගමනය වීමේ වැඩි ප්‍රවනතාවය පැවතීම සම්බන්ධයෙන් ලාංකික සමාජය තුල කතිකාවතක් පවතී. කොපමණ ගැටලු ප්‍රමාණයක් ඇති වූවත් කාන්තාවන් විදේශගතවීම් තවමත් සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුවීමක් දැකිය නොහැක. එබැවින් මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වශයෙන් විදේශගත වූ කාන්තාවන්ට තමන්ගේ අපේක්ෂාවන් සඵල කර ගැනීමට හැකි වීද, එසේම තම කුටුම්භ සාමාජිකයන්ගේ ජීවන රටාවේ ඇති වී ඇති වෙනස්වීම් , විදේශ ගත වන කාන්තාවන්ගේ ස්වභාවය හා විදේශයන්හිදී ඔවුන් මුහුණ දෙන ගැටලු යනාදියද අධ්‍යයනයට භාජනය කෙරිණ.

**අධ්‍යයන ප්‍රදේශය සහ ක්‍රමවේදය**

මෙම පරීක්ෂණය සඳහා අදාළ කරගන්නා නියදි ප්‍රදේශය වන පලාපත්වල ග්‍රාම නිලධාරී වසමට තම්මැන්නාව, උඩතම්මැන්නාව, පලාපත්වල, කුළුපෙරුමාව, ඌරැව, දෙමටැව හා කුඹුක්ගැටේ යන ගම් හතක් අයත් වේ. මෙම නියැදියට අදාළ ග්‍රාම නිලධාරී වසමේ වර්ග ප්‍රමාණය හෙක්ටයාර් 688.1 ක් වන අතර ජීවත්වන පවුල් සංඛ්‍යාව 222 කි. මෙම ප්‍රදේශයේ ජනගහන ව්‍යුහය පිළිබඳව විමසීමේ දී පුරුෂයන්ගේ සංඛ්‍යාව 308ක් වන අතර ස්ත්‍රීන්ගේ සංඛ්‍යාව 318 කි. එනම් පුරුෂ පක්ෂයේ ප්‍රතිශතය 49.21% ක් වන විට කාන්තාවන්ගේ ප්‍රතිශතය 50.79% කි. ජනවර්ගය පිළිබඳව විමසීමේ දී 100% ක් ම සිංහල ජාතියට අයත් වන අතර බහුතරයක් වන 52.77% කගේ ම රැකියාව වනුයේ කෘෂිකර්මාන්තය යි. 7.59% ක් පෞද්ගලික අංශයේ රැකියාවල ද, 20.74% දෙනෙකු කුලී වැඩවලත් 9.81% ක් දෙනා විදේශ රැකියාවල ද නිරත වේ. මෙම ජනතාවගේ අධ්‍යාපන තත්ත්වය දෙස බැලීමේ දී 54.72% ක් ම ද්වීතීක අධ්‍යාපනය ලබා ඇත.

මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්ත මෙන්ම ද්වීතීක දත්ත භාවිතා කෙරිණ. ප්‍රාථමික දත්ත රැස්කිරීම සඳහා snow ball නියදීමේ ක්‍රමය භාවිතා කරමින් නියදිය තෝරා ගත් අතර විදේශ ගත වී පැමිණි කාන්තාවන් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම මඟින් අවශ්‍ය තොරතුරු ලබා ගන්නා ලදී. විදේශීය ශ්‍රම සංක්‍රමණ සම්බන්ධයෙන් පවත්නා න්‍යායාත්මක කරුණු ,ගැටළු යනාදිය ද්විතික දත්ත මඟින් සපයා ගෙන ඇති අතර මේ සඳහා ආශ්‍රිත ග්‍රන්ථ, පුවත්පත්, ලිපි, සඟරා, අන්තර්ජාලය හා මහබැංකු වාර්තාවන් යනාදිය පරිශීලනය කර ඇත. තවද ප්‍රමාණාත්මක දත්ත ඉදිරිපත් කිරිමට හා විශ්ලේෂණයට වගු, ප්‍රස්ථාර මෙන්ම සංඛ්‍යානමය ශිල්ප ක්‍රම භාවිතා කර ඇති අතර ගුණාත්මක දත්ත විශ්ලේෂණයට විස්තරාමක ක්‍රමය භාවිතා කරන ලදී.

**දත්ත ඉදිරිපත් කිරීම හා විශ්ලේෂණය**

මෙම පර්යේෂණය ශ්‍රම විගමනය වු කාන්තාවන් සම්බන්ධයෙන් පමණක් වන අතර නියැදියට අදාළ කාන්තාවන් සියළු දෙනාම විවාහක කාන්තාවන් වන අතර ඔවුන්ගේ


දරුවන් දෙමව්පිය රැකවරණය යටතේ පසුවිය යුතු දරුවන් ය. එනම් වයස අවුරුදු 12ට අඩු දරුවන්ය. මෙසේ විදේශගත වූ කාන්තාවන්ගේ සමාජීය හා ආර්ථික පසුබිම අධ්‍යයනයේ දී දැකිය හැකි වූ ලක්ෂණයන් අතර බහුතරයක් කාන්තාවන් එනම් සියයට 80ක් අ.පො.ස. (සා/පෙළ) දක්වා අධ්‍යාපනය ලබා ඇති අතර ඉතිරි සියයට 20 ලබා ඇත්තේ ප්‍රාථමික අධ්‍යාපනය පමණි. මෙම සියළුම කාන්තාවන් සිංහල ජාතියට අයත් බුද්ධාගම ආගම වශයෙන් අදහන අය වන අතර වයස් ව්‍යුහය දෙස බැලීමේ දී සියයට 63.3 ක් විදේශ සේවාවන්හි නිරත වී ඇත්තේ වයස අවුරුදු 25 - 35ත් වයස් කාණ්ඩයේ ය. තවත් සියයට 36.7ක ප්‍රතිශතයක් 35 - 45 අතර වයස් කාණ්ඩයට අයත් ය. එනම් මෙම සියළුම කාන්තාවන් වැඩකළ හැකි වයසේ පසුවන ශ්‍රම බලකායට අයත් වූවන් ය. මෙසේ විදේශගත වූ කාන්තාවන්ගේ ස්වාමිපුරුෂයාගේ රැකියාවන් හි ස්වරූපය අධ්‍යයනයේ දී දැකිය හැකි වූයේ බහුතරයකගේ ස්වාමිපුරුෂයන්ගේ රැකියාව වූයේ ගොවිතැනය. එනම් ගොවිතැන රැකියාව වශයෙන් සිදුකරන පවුල් ගණන සියයට 76.6 ක් විය. විදේශගත වූ කාන්තාවන්ගේ ස්වාමි පුරුෂයන්ගෙන් සියයට 96.4 ක් තරම් වූ අති විශාල පිරිස ස්ථිර ආදායමක් නොලබන රැකියාවන් හි නිරත වන්නෝ ය. මෙය මෙම කාන්තාවන් විදේශ ගතවීම සඳහා බලපෑ ප්‍රබලම සාධකයක් වී ඇත.

මෙම කාන්තාවන් සේවයේ යෙදී සිටින රටවල් වූයේ සෞදි අරාබිය, ඩුබායි, ලෙබනන්, කුවේට් හා ජෝර්දානයයි. එයින් බහුතරයක් කාන්තාවන් සෞදි අරාබිය තුළ රැකියාවන්හි නිරත වී සිටිති (වගු අංක 03).

වගු අංක 3. ගමනාන්තය අනුව විදේශ සේවා සංක්‍රමණ-2010

| රට | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| සෞදි අරාබිය | 15 | 50% |
| ඩුබායි | 07 | 23.3% |
| ලෙබනන් | 06 | 20% |
| කුවේට් | 03 | 10% |
| ජෝර්දානය | 02 | 6.6% |

මූලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත 2011





*රූපසටහන 2 . ශ්‍රම කාණ්ඩ අනුව විදේශ සේවා නියුක්තිය- 2010*

විදේශගත වූ කාන්තාවන්ගෙන් සියයට 93.3ක් ගෘහ සේවිකාවන් වන අතර ඇඟළුම් සේවිකාවන් වශයෙන් විදේශ ගතවූව ඇත්තේ සියයට 6.4 කි.

මව විදේශ ගතවීම කුටුම්භයේ සංවර්ධනයට ධනාත්මක හා ඍණාත්මක වශයෙන් බලපෑම් සිදුකර ඇති බව පර්යේෂණය තුළින් හඳුනාගත හැකි විය. සියයට 100 ක්ම කාන්තාවන් තම ආර්ථික දුෂ්කරතාවන් හේතුවෙන් එනම් නිවසක් තනාගැනීමට, දරුවන්ගේ අධ්‍යාපනයට සහ සැමියාට ප්‍රමාණවත් ආදායමක් නොලැබීම වැනි හේතු නිසා විදේශ ගත වී ඇත. මෙසේ විදේශ ගත වූ කාන්තාවන් සමඟ සාකච්ඡාවේ දී අනාවරණය කර ගත හැකි වූ විශේෂිත කරුණක් නම් සියයට 63.4 කට කිසිඳු අපේක්ෂාවක් ඉටුකර ගැනීමට නොහැකි වූ බවයි. ඒ සඳහා සැමියාගේ බීමත්කම හා එවු මුදල් අනවශ්‍ය ලෙස නාස්ති කිරීම ප්‍රධාන වශයෙන් ම බලපා ඇත. මෙම කරුණු අනුව බලන කළ තම දරුවන්ගේ අනාගතය හා තම පවුලේ අනාගතය වෙනුවෙන් කැප කළ කාලයට නිසි වටිනාකමක් ලැබී නැත. තව ද සේවා ස්ථානයේදී මුහුණ දෙන්නට වූ ශාරීරික හා මානසික හේතුන් නිසා ගිවිසුම්ගත සේවා කාලයක් ගත කිරීමට නොහැකි වූ කාන්තාවන් තමන් විදේශගත වීමට පෙර තමන් සිටි තත්ත්වයට වඩා අන්ත තත්ත්වයක අද ජීවත් වන බව පැවසූහ.

පවුල නැමැති සමාජ සංස්ථාව නිර්මාණය වූ දා පටන් මේ වනතෙක් ම දරුවන්ට එහි අද්වීතීය වටිනාකමක් හිමි වේ. මෙවන් වටිනාකමක් හිමි දරුවන් යහපත් පුද්ගලයන් ලෙස සමාජගත කිරීමේ වගකීම ප්‍රධාන වශයෙන් ම පැවරෙන්නේ තම දෙමව්පියන්ට ය. මුල් ගුරුතුමිය වශයෙන් පිදුම් ලබන මව්ට පවුල තුළ වැඩි වගකීමක් තම දරුවන් කෙරේ පැවරී ඇත. යහපත් පුද්ගලයෙකු වශයෙන් තම දරුවන් සමාජානුයෝජනය කිරීමට නොහැකි වීම තුළ එය මුළු සමාජයටම ගැටළුවක් වන්නේ ය. විදේශගත වූ කාන්තාවන්ගේ දරුවන්ගේ තත්ත්වය විමසීමේ දී එය බේදවාචකයක් බවට පත්ව ඇත. මව විදේශගත වීම තුළ තම දරුවන්ගේ වගකීම වෙනත් කෙනෙකු වෙත විතැන් කිරීමට ඔවුනට සිදු වී ඇත.

වගු අංක 4. දරුවන් රැකබලා ගැනීමට බාර දීම




මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත 2011

ඉහත වගුවට අනුව බහුතරයක් කාන්තාවන් තම දරුවන්ගේ වගකීම තම ස්වාමිපුරුෂයා වෙත විතැන් කර ඇති බව දැකිය හැකිය. එසේ මව් නොමැතිව හැදී වැඩී ඇති දරුවන්ගේ තත්ත්වය ඔවුන් පැමිණි පසු විමසීමේ දී ලැබූ තොරතුරු අනුව පෙනී ගියේ දරුවන් වැඩි පිරිසකගේ අධ්‍යාපනය පවා අඛණ්ඩව සිදු වී නැති බව ය. 36.7% ක් අධ්‍යාපනය අතර මග නතර වීම, 10% ක් සමාජ විරෝධී ක්‍රියාවන්ට යොමු වී තිබීම හා 23.3%ක් නරක ආශ්‍රයට යොමු වීම සිදුව ඇත. මව් නොමැති වුවත් 30% ක් කාන්තාවන්ගේ දරුවන් තමා අපේක්ෂා කළ අයුරින් ම සිය අධ්‍යාපන කටයුතු සිදු කරගෙන යනු ලබයි.

වගු අංක 5. විදේශයන්හි සේවය කර ඇති කාලය හා වාර සංඛ්‍යාව

| සේවයේ නියුක්ත වූ කාලය | | සේවයේ නියුක්ත වූ වාර ගණන | |
|---|---|---|---|
| අවුරුදු | ප්‍රතිශතය | වාර ගණන | ප්‍රතිශතය |
| අවුරුද්දකට අඩු | 13.3 | වාර 01ක් | 83.3 |
| අවුරුදු 2ක් | 63.4 | වාර 02ක් | 10 |
| අවුරුදු 3ක් | 23.3 | වාර 03ක් | 6.7 |
| එකතුව | 100 | | 100 |

මූලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත 2010

විදේශ ගත වූ කාන්තාවන් සම්බන්ධයෙන් කළ අධ්‍යයනයේදී අනාවරණය වූ තවත් ලක්ෂණයක් වශයෙන් සියයට 83.3 ක් කාන්තාවන් විදේශයන්හි සේවයේ නිරත වී ඇත්තේ එක් වාරයක් පමණි. තවද ඔවුන් කිසිවෙකු නැවත විදේශයන්හි සේවය සඳහා පිටත්ව යාමට අකමැත්තක් දක්වන අතර ඒ සඳහා හේතු වී ඇති ප්‍රධාන ගැටළුව වශයෙන් දැක්වූයේ තම දරුවන්ගේ අනාගතය සුරක්ෂිත නොවීමය (වගු අංක 05).

තව ද විදේශ සේවයේ නියුක්ත වූ කාන්තාවන්ගෙන් බහුතරයකගේ ස්වාමිවරුන් මත්පැනට ඇබ්බැහි වී ඇත. තම බිරිඳ විදේශ ගත වීමට පෙරත් මත්පැන් පානය කළත් එහි යම් පාලනයක් සිදු වී ඇත. නමුත් ඇය විදේශ ගතවීමත් සමග එම තත්ත්වය වෙනස් වී ඇත. ස්වාමියා - භාර්යාව ලෙස පුද්ගලයන් දෙදෙනෙකුගෙන් යුත් ඒකකයක් ලෙසින් කටයුතු කිරීමේ දී බිරිඳක, ගෘහණියක ලෙසත් ඇයගෙන් ලැබුණ සහයෝගය ගිලිහී යාමත් සමග නිවසේ සියළු කටයුතුවල වගකීම තනි පුද්ගලයකු වෙතට පත්වීම තුළින් ඇතිවන මානසික පීඩනය මෙලෙස මත්පැනට ඇබ්බැහි වීමට හේතුවක් වී ඇත.

එසේම විදේශ ගතවීම තුළ රැකියා ස්ථානයේ දී ද විවිධ වූ ගැටළු වලට ඔවුන් මුහුණ දී ඇත. 83.3% කට ම මුහුණ දීමට සිදුවී ඇති ප්‍රධාන ගැටළුව වශයෙන් දැක්වූයේ වැටුප් ගෙවීම ප්‍රමාද වීම ය. තවද විවේකය අවම වීම (වැඩකරන කාලය දීර්ඝ වීම), තම රට සමග සබඳතා පැවැත්වීමට නොහැකි වීම යන ගැටලුවලටද ඔවුන් මුහුණ දී ඇත. එසේ ශ්‍රී ලාංකිකයන්ට විදේශ රටක දී යම් ගැටළුකාරී තත්ත්වයන්ට මුහුණදීම සිදුවුවත් ඒ බව එම රටවල ස්ථාපිත කර ඇති මෙරට තානාපති කාර්යාලවලට දැන්වීමේ හැකියාව තිබුණත් සියයට 80 ක් වූ බහුතර කාන්තාවන්ට ඒ සම්බන්ධව පැහැදිලි අවබෝධයක්වත් නොමැති බව අනාවරණය විය.

විදේශීය සේවා නියුක්තියෙහි යෙදුණ කිසිදු අයෙකු ඉතාමත් කැමැත්තෙන් විදේශ ගත වී නොමැති අතර දේශීය රැකියා වෙළඳපළ තුළ රැකියා අවස්ථා නොමැති වීමෙන් මෙසේ විදේශ ගත වීමට සිදුවී ඇත. සක්‍රීය ශ්‍රම බලකායට අයත් මෙම පිරිස වෙනුවෙන් රැකියා අවස්ථා නිර්මාණයට යොමු වීම තුළින් මෙම ආර්ථික ගැටළුවලට පිළියමක් ලබා දිය හැකි වනු ඇත.

**නිගමන සහ යෝජනා**

ශ්‍රම විභජනය මත පදනම් වූ අතීත සමාජ රටාවෙන් මිදී විද්‍යාව හා තාක්ෂණය අතින් දියුණු විශ්ව ගම්මාන සංකල්පය තුළ ජීවත්වන වර්තමාන සමාජයේ කාන්තාව පුරුෂයා හා සමානව ආර්ථික, සමාජීය හා සංස්කෘතික ආදී සෑම අංශයක් තුළම ක්‍රියාකරයි. පුළුල් වූ ආර්ථික රටාව තුළ ශ්‍රම විගමනය සඳහා දොරටු විවර වූ පසු පුරුෂයන්ට අමතරව කාන්තාවන් ද ශ්‍රම විගමනය වන්නන් බවට පත්ව ඇත.

මෙම අධ්‍යයනයට අදාළ විදේශ ගත වූ කාන්තාවන් සියලු දෙනා ම විවාහකයන් වන අතර අවුරුදු 12 ට අඩු දරුවන් සිටින මව්වරුන් වීම විශේෂිත ය. කුටුම්භයන් තුළ වන ආර්ථික අපහසුතා හේතුවෙන් විශේෂයෙන් ම කෙටි කාලීනව එම අවශ්‍යතා ඉටුකර ගැනීම අරමුණු කර ගනිමින් මෙසේ විදේශ ගත වී ඇත. විදේශ ගතවීම කෙරෙහි හේතු වූ ආර්ථික අපහසුතා අතර අංග සම්පූර්ණ නිවසක් නොමැති වීමත්, සැමියාට ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති වීමත් ප්‍රධාන හේතු වී ඇත.

විදේශ ගතවන කාන්තාවන්ගෙන් සියළු දෙනාටම තම අපේක්ෂාවන් ඉටු කර ගැනීමට හැකියාවක් ලැබී නැති අතර 63.4% කට කිසිඳු අපේක්ෂාවක් ඉටු කරගැනීමට නොහැකි වී ඇත. ඒ සඳහා සැමියාගේ බීමත්කම සහ එවූ මුදල් අනවශ්‍ය ලෙස නාස්ති කිරීම ප්‍රධාන වශයෙන් ම බලපා ඇත. සේවා ස්ථානයේ දී ඇති වූ ශාරිරික හා මානසික හේතුන් මත ගිවිසුම්ගත සේවා කාලයක් ගත කිරීමට නොහැකි වූ කාන්තාවන්ගේ ද සිය අපේක්ෂාවන් ඉටුකර ගත නොහැකි වී ඇත . තමන් සිටි ආර්ථික තත්ත්වයටත් වඩා පහත් මට්ටමකට වැටී ඇත. මන් ද විදේශ ගත වීම හේතුවෙන් ලබාගත් ණය ගෙවීමට මාර්ගයක් නොමැති වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් ම බල පා ඇත.

දරුවන්ගේ ළමා කාලය ඔහුගේ/ඇයගේ ජීවිතයේ පදනම යි. ළමා කාලයේ දී දරුවනට අවශ්‍ය අධ්‍යාපනය, ආරක්ෂාව, පෝෂණය නිසි ආකාරයට ලැබීම තුළින් අනාගතයේ දී මනා පෞරුෂත්වයකින් හෙබි මිනිසෙක් ගොඩ නැගේ. නමුත් විදේශ ගත වූ කාන්තාවන්ගේ දරුවන්ගේ තත්ත්වය විමසීමේ දී බොහෝ දරුවන්ගේ තත්ත්වය ඛේදවාදකයක් බවට පත් ව ඇත. මන් ද ඔවුන්ගේ අධ්‍යාපනය අතරමඟ නතර වීම, සොරකම් කිරීම, මත් ද්‍රව්‍ය, මත්පැන් භාවිතය ආදී සමාජ විරෝධී ක්‍රියාවන්ට පෙළඹී ඇත. දරුවන් මෙසේ නොමඟට යාමට මව් විදේශ ගතවීමම බලපෑම් නොකළත් එය ඒ සඳහා බලපා ඇති එක් සාධකයක් වේ. එම නිසා මෙම දරුවන් නිසි ආකාරයට රැකබලා ගැනීම සමාජයේ ම වගකීමක් වන්නේ ය. එබැවින් මෙසේ විදේශ ගතවන කාන්තාවන්ගේ දරුවන් රැකබලා ගැනීමට අවශ්‍ය නම් ඒ සඳහා දිස්ත්‍රික් මට්ටමින් හෝ ළමා සුරැකුම් මධ්‍යස්ථාන නිසි අධීක්ෂණයක් යටතේ සිදු කිරීම යෝග්‍ය බව ඔවුන් දක්වති. එමඟින් දරුවන්ගේ රැකවරණය සම්බන්ධයෙන් පෙරට වඩා යම් ආරක්ෂණයක් සැලසෙන අතර ළමයින් අතර ද ඇතිවන ඍණාත්මක අදහස් නැති වී යයි.

කාන්තාවන් විදේශ ගතවීම තුළින් අහිතකර බලපෑම් ඇතිවනුයේ දරුවන් හට පමණක් නොව, එය තම ස්වාමිපුරුෂයන් කෙරහි ද අහිතකර ආකාරයට බලපෑම් එල්ල කර ඇත. බිරිඳක, ගෘහනියක ලෙස ඇයගෙන් ලැබුණ සහයෝගය ගිලිහී යාමත් සමඟ නිවසේ සියළු කටයුතුවල වගකීම මෙන්ම දරුවන්ගේ වගකීම ද තනි පුද්ගලයකු වෙතම පත්වීම තුළින් ඇතිවන මානසික පීඩනය මෙලෙස මත්පැනට ඇබ්බැහි වීමට හේතු වී ඇත. එහි දී ඔවුන් දැනුවත් කිරීම තුළින් ඔවුන්ගේ ආකල්පමය වෙනසක් ඇති කර ඔවුන්ව එම තත්ත්වයෙන් මුදවා ගැනීමට කටයුතු කළ යුතු ය. මෙම පර්යේෂණය තුළින් අනාවරණය වූ තවත් කරුණක් නම් තම ස්වාමිදියණිය විදේශ ගතවීම කෙරේ කැමැත්ත දැක් වූ ස්වාමිවරුන්ගේ ප්‍රතිශතය සියයට 33.3 ක් වන අතර අනෙක් සියයට 66.7ක ඇය විදේශ ගතවීම කෙරෙහි කිසිඳු කැමැත්තක් දක්වා නැත. නමුත් පවත්නා ආර්ථිකමය ගැටලුවලට විකල්ම පිළියමක් නොවූයෙන් කාන්තාවන් මෙසේ විදේශගත වී ඇත. ඒ තුළින් තමන් අපේක්ෂා කළ අරමුණු ඉෂ්ට වී නොමැති අතර ම තම ස්වාමිවරුන් මෙන් ම දරුවන්ගේ ජීවිත රටාව ද අහිතකර ආකාරයකට වෙනස් වී ඇත.

මෙසේ දරුවන් හා ස්වාමිවරුන් සම්බන්ධයෙන් වන සෘණාත්මක බලපෑම් දෙස බැලීමේදී කාන්තා විදේශ සේවා නියුක්තිය තහනම් කිරීම යෝග්‍ය බවට යොජනා කළ හැක්කේ ඔවුන් මුහුණ පා ඇති ආර්ථික ගැටලු සඳහා පිළියම් දේශීය වශයෙන් සැපයීමට හැකියාවක් ඇත්තේ නම් පමණි. රැකියා සඳහා විදේශගත වීම තුල තම දරුවන්ට හා ස්වාමිපුරුෂයන්ට වන අපහසුතාවන් පිළිබඳව දැනුවත් කිරීම තුලින් රැකියාවන් සඳහා විදේශගත වීම වෙනුවට වෙනත් ආර්ථික කටයුත්තකට යොමු වීමට ඉඩ ඇත. විශේෂයෙන් ම කාන්තාවන් දැනුවත් කිරීමේ වැඩසටහන් ගම් මට්ටමින් පැවැත්වීම අවශ්‍යයෙන්ම කළ යුතු වන අතර කළ හැකි ස්වයංරැකියා සම්බන්ධයෙන් උපදෙස් මෙන් ම අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබා ගැනීමට මාර්ගයන් ද පෙන්වා දීම කළ යුතුය . මන්ද දේශීය වශයෙන් යම් රැකියාවක් කිරීමට අවස්ථාවක් හිමි වේ නම් මෙසේ විදේශ ගත වීමට අවශ්‍ය නොවන බව බහුතරයකගේ අදහස වන නිසාවෙනි.

**ආශ්‍රිත ග්‍රන්ථ**

Central Bank of Sri Lanka. 2000-2012. Annual Reports. Colombo:CBSL.

Department of Census and Statistics. 2009/2010. Household Income and Expenditure Survey. Colombo: Government of Sri Lanka.

Gunathilaka, Godfrey., 1998. The role of networks and community structure - international migration from Sri Lanka, in emigration dynamics in developing countries; Vol. 47

ගුණසේකර, සාවිත්‍රී., 1995. ලාංකීක කාන්තාවගේ නෛතික තත්වය මත ඇතිකල සංඝටනය. විනිවිද, එක්සත් ජාතීන්ගේ කාන්තා දශකය, කාන්තා දශකය හා ශ්‍රී ලංකා කාන්තාවගේ ප්‍රගතිය, කාන්තා පර්යේෂණ කේන්ද්‍රය, කොළඹ. පි. 21-129.